# කොටු වී සිටින්නන් හා ප්‍රභාකරන්

දෙමළ ත්‍රස්තවාදය විශාල වශයෙන් පරාජය කෙරී ඇත. එහෙත් දෙමළ ජාතිවාදය පැරදී නැත. එසේ ම දෙමළ බෙදුම්වාදය ද යම් පමණකින්වත් තවමත් පවතියි. මේ සියල්ල මුළුමනින් ම පරාජය කරන තුරු මෙරටට පූර්ණ නිදහසක් ගැන කතාකළ නො හැකි ය. ඒ පරාජය කිරීමෙහි ලා තවමත් මහා පරිමාණයේ බාධක පවතියි. ඉන් ප්‍රධානවන්නේ බටහිරයන්ගේ හා ඉන්දියාවේ බලපෑම ය.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රධාන ආණ්ඩුව පසුගිය අවුරුදු දෙකහමාරකට වැඩි කාලයක් තිස්සේ මේ බලපෑම්වලට සාර්ථකව මුහුණ දුන්නේ ය. බටහිරයන්ගේ ඊනියා සාම යෝජනා සටන් විරාම අපට කොටින් පරාජය කිරීමට බැරි යැයි කීමේ බැරිවාදම පල්ලියේ මැදිහත්වීම්, සිංහල බෞද්ධ සංස්කෘතියෙහි නොවූ රනිල් රවී ජයලත් ආදීන්ගේ බොරු ප්‍රචාර හමුදාවට එරෙහිවූ අපහාස උපහාස ආදිය කෙවිටෙන් ඉවත ලූ ගැරඬි හැවක් මෙන් ප්‍රතික්ෂෙප කිරීමට ආණ්ඩුවට හැකිවිය.

අද ආණ්ඩුවට ත්‍රස්තවාදය පරාජය කිරීම සම්බන්ධයෙන් අවසාන බාධකයට මුහුණ පෑමට සිදු වී ඇත. පණස්දහසකට වැඩි ජනතාවක් කොටි සංවිධානය මගින් මුලතිව් ප්‍රදේශයෙහි මිනිස් පළිහක් ලෙස යොදා ගැනෙති. බටහිර රටවල්, ජපානය හා ඉන්දියාව ඒ ඒ මට්ටමින් ආණ්ඩුවට බලපෑම් කරයි. බටහිරයන් හා ජපානය මිනිස් පළිහට සුළුවෙන් හෝ උවදුරක් සිදුවුවහොත් අප ආක්‍රමණය කරන බවට තර්ජනය කරන බවක් පෙනෙන්නට තිබේ. පසුගිය දිනවල බටහිරයෝ අන් රටක් ආක්‍රමණය කිරීම සඳහා ආරක්ෂාකිරීමට ඇති අයිතිය (රයිට් ටු ප්‍රොටෙක්ට්) යොදාගැනීමේ කලාව සාකච්ඡා කළහ. මෙරට සිටින බටහිරයන්ගේ ඇම්බැට් ඒජන්තයෝ රාජ්‍ය නොවන සංවිධානවල, විශ්වවිද්‍යාලවල හා ඊනියා පර්යේෂණ ආයතනවල කුලියට සේවය කරමින් බටහිරයන්ගේ ආරක්ෂාකිරීමට ඇති අයිතිය ආරක්ෂා කළහ.

ඉන්දියාව තමිල්නාඩුවේ හා වෙනත් ප්‍රදේශවල තර්ජනවලට ප්‍රතිචාර දක්වමින් විවිධ යෝජනා ඉදිරිපත් කෙළේ ය. ඇතැම් විට රෝ හෙවත් ඉන්දියාවේ ඔත්තු සේවය ද මේ ප්‍රතිචාර වලට එහා ගියේ ය. අද වන විට මේ ප්‍රශ්නය මුල්කරගෙන තමිල්නාඩුවේ වැඩ වර්ජනයක් පවතින්නේ ඒ ඔස්සේ ඉන්දීය රාජ්‍යය මගින් ලංකාණ්ඩුවට බලපෑම් කිරීමට ය. ඒ මිනිස් පළිහක් ලෙස යොදා ගැනෙන පිරිස කෙරෙහි වූ කරුණාවක් කරුණානිධිට ඇතිවීම නිසා නොව ඉන් දේශපාලන වාසියක් ලබාගැනීමට ය.

කොටි විසින් කොටු කරනු ලැබ ඇති පිරිස් සංඛ්‍යාව පිළිබඳ විවිධ මත පළවෙයි. ඇතැමකුට අනුව ඒ ලක්ෂ දෙකකි නැතහොත් ලක්ෂ දෙකහමාරකි. ජයලත් ජයවර්ධන මහතාට අනුව ඒ ප්‍රමාණය ලක්ෂ හතරක් වෙයි. ඒ අතර හැබිණියන් දෙදහසක් සිටින බව ද ජයවර්ධන මහතා ප්‍රචාරය කරයි. මොවුන් සම්බන්ධයෙන් විස්තර ජයවර්ධන මහතාට ලැබෙන්නේ කෙසේ දැයි අපි නොදනිමු. කොටි තර්ජන තිබූ ප්‍රදේශවලින් සිංහලයන් එළවීමට ඔවුන්ට සයිරන් නලා බෙදූ ජයවර්ධන මහතාගේ පක්ෂපාතීත්වය ඇත්තේ කොටින් පෝෂණය කළ පූජකවරුන්ට මිස හිතවත්කම් පෙන්වන භික්ෂූන් වහන්සේට හෝ වෙනත් අයකුට හෝ නොවන බව තේරුම් හත්විට ඔහුගේ ප්‍රකාශ කා වෙනුවෙන් ද යන්න පැහැදිලි වෙයි.

කොටු වී ඇති පිරිස කොපමණ වුවත් ඊනියා ආධාර කණ්ඩායම, ඉන්දියාව හා බලපෑම් කරන වෙනත් අය විවිධ යෝජනා ඔස්සේ ආණ්ඩුවට බලපෑම් කරන බව රහසක් නො වේ. පසුගිය දිනවල අකාෂි, ඉන්දීය විදේශ ලේකම් ආදීන් මෙරටට පැමිණියේ මේ පිරිස දඩමීමා කරගනිමින් ප්‍රභාකරන් ගලවා ගැනීමට ය. අද ඊනියා ආධාර කණ්ඩායම තාවකාලික සටන් විරාමයක් ගැන කතා කරයි. ඔවුන් කොටින්ට ද ආයුධ බිම තබා සාකච්ඡා කරන මෙන් ඉල්ලා ඇත. මේ සියල්ලෙහි පසුබිමෙහි ඇත්තේ හා තිබුණේ කොටින් නැවත වරක් ශක්තිමත් කිරීම ය.

මේ අතර ජාත්‍යන්තර සංවිධාන යැයි කියන කණ්ඩායම් නැවතත් වන්නියට යෑමට අවසර ඉල්ලා ඇත. අවුරුදු ගණනාවක් තිස්සේ මානුෂික ආධාර ගෙන යන්නේ යැයි කියමින් වන්නියට ගිය මොවුන් ආධාර කර ඇත්තේ කොටින්ට

© Prof. Nalin De Silva

බව පසුගිය දා හමුදාව විසින් කරන ලද මානුෂික මෙහෙයුම්වල දී මෙතෙක් ඒ ගැන විශ්වාසයක් නොතිබූ අයට ද දැනෙන අයුරින් එළිදරව් විය. මේ කිසිම රටකට හෝ සංවිධානයකට හෝ වන්නියට යෑමට ඉඩ නොදිය යුතු ය. රාජ්‍යය රෑ වැටුණු වළේ දවල් වැටීමට සූදානම් නොවිය යුතු ය. එමෙන් ම කිසිම සටන් විරාමයකට හෝ සාකච්ඡාවකට හෝ එකඟ වුවහොත් ආණ්ඩුව සිය දිවි නසාගනු ඇත.

පසුගිය දා ආණ්ඩුව කොටු වී සිටින්නනන්ට ඉන් පැන ඒමට පැය හතළිස් අටක කාලයක් ලබා දුන්නේ ය. මෙය එක්තරා ආකාරයක සටන් විරාමයක් විය. ඒ බටහිරයන්ගේ, ජපානයේ හා ඉන්දියාවේ බලපෑම මධ්‍යයේ කරන ලද්දක් යැයි සිතිය හැකි ය. බටහිරයන් එහි දී ආරක්ෂාකිරීමට ඇති අයිතියට (එවැනි අයිතියක් කිසිවකුට හෝ රාජ්‍යයකට හෝ නැතත්) මුවා වී රට ආක්‍රමණය කිරීමට වුව ද තර්ජනය කරන්නට ඇතැයි සිතිය හැකි ය. ඇතැම් විට උතුරු පළාතේ මෙතරම් ගුවන් පථ තනා ඇත්තේ හදිසි අවස්ථාවක බටහිරයන්ට එහි යුද යානා බැස්ස වීම සඳහා වීය හැකි ය. කෙසේ හෝ ආණ්ඩුව කොටු වී සිටින්නනන්ට පැන යෑමට පැය හතළිස් අටක් ලබා දුන් අතර සටන් මුක්ත කලාපයක් ද ඇති කෙළේ ය.

බටහිරයන් මේ සියල්ල කරවීමට උත්සාහ ගන්නේ ඒ කොටු වී සිටින පිරිස වෙනුවෙන් නොව ප්‍රභාකරන් හා කොටි වෙනුවෙන් බව පැහැදිලි ය. බටහිරයන්ට අවුරුදු පන්සියයක් තිස්සේ නොතිබූ මානව දයාවක් හදිසියේ ඇති වී ඒ පිරිස වෙනුවෙන් කටයුතු කරන්නේ යැයි බටහිර ගැත්තකු හැරෙන්නට වෙනත් කිසිවෙක් කිසිවිටෙකවත් නො සිතති. හිරෝෂිමා හා නාගසාකි නගරවලට පරමාණු බෝම්බ දැමීමේ දී හෝ අද ඇෆ්ගනිස්ථානයේ බෝම්බ දමද්දී හෝ නොතිබි නොමැති මානව දයාවක් මේ හදිසියේ ඇතිවීමට කිසිදු ඉඩක් නැත. බටහිරයන්ට ප්‍රභාකරන් ගලවා ගැනීමට විශේෂ උනන්දුවක් ඇත. අර පිරිස දඩමීමා කරගෙන ලංකාව ආක්‍රමණය කිරීමේ තර්ජනාංගුලිය ඔසොවා ප්‍රභාකරන් ගෙනයෑමට ඔවුන්ට අවශ්‍ය වෙයි. ඔහුට විරුද්ධ නඩු විභාගයක් පවත්වා මරණීය දණ්ඩනය නියම කර ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව ඊනියා තාවකාලික හෝ වෙනත් ආකාරයක හෝ සටන් විරාම ඔස්සේ අපෙන් උදුරා ගැනීමට තැත්කරන (ඇතැම් විට දැනටමත් ප්‍රභාකරන් උදුරා ගෙන ඇත්දැයි අපි නො දනිමු) මේ ද්‍රෝහියෝ සදාම් හුසේන් එල්ලා දැමූහ. බටහිරයන් මොන බයිලා කීව ද ඔවුන්ට අනුව ලෝකයේ ත්‍රස්තවාද වර්ග දෙකක් ඇත. එක් වර්ගයක් ඇමරිකාවට, බටහිරට, ඇමෙරිකාවේ කුළුපග රටවලට හා පොදුවේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහි ත්‍රස්තවාද ය. අනෙක් වර්ගය අනෙක් රටවලට හෝ අනෙක් සංස්කෘතීන්ට හෝ එරෙහි ත්‍රස්තවාද ය. ඒ දෙවැනි වර්ගයේ ත්‍රස්තවාදවලට බටහිරයන්ගේ නොමඳ සහාය ලැබෙයි. කොටි ද දෙවැනි වර්ගයේ ත්‍රස්තවාදීහු වෙති.

එක් අතකින් ගත්කල අප එසේ කීම නිවැරදි නොවිය හැකි ය. බටහිරයන්ට අනුව ලෝකයේ ඇත්තේ පළමු වර්ගයේ ත්‍රස්තවාදීන් පමණක් යැයි කිව හැකි ය. බටහිරයන්ට දෙවැනි වර්ගයේ ත්‍රස්තවාදීහු ත්‍රස්තවාදීන් නොව සටන්කාමීහු විමුක්තිදායකයෝ වෙති. තමන් අපක්ෂපාතී යැයි ලෝකයාට හඬගා කියන බීබීසිය (එහි අගුපිලේ ඇති සංදේශය පමණක් නොවේ) කිසිදා කොටින් ත්‍රස්තවාදීන් ලෙස නො හඳුන්වයි. බටහිරයන් සමස්තයක් ලෙස ගත්කල පසුගිය අවුරුදු පන්සියයක කාලයෙහි ක්‍රියාකර ඇත්තේ මානව විරෝධී ආකාරයකට ය. එලෙසින් ම සමස්තයක් ලෙස ගත්කල බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ම මානව විරෝධී ව්‍යාපෘතියකි.

කොටු වී සිටින පිරිසට අපි අනුකම්පා කරමු. බටහිරයෝ ඔවුන් නිදහස් කරන්නැයි කොටින්ට බල නො කරති. ඒ වෙනුවට සටන් විරාම හා සාකච්ඡා බයිලා කියති. බටහිරයන්ගේ බයිලා තර්ජන ගර්ජන හමුවේ ආණ්ඩුව මෙතෙක් කල් නොසැලී ක්‍රියාකළ ආකාරයට ම කොටු වී සිටින පිරිස සම්බන්ධයෙන් ද ක්‍රියාත්මක විය යුතු ය. කොටු වී සිටින පිරිසට අනුකම්පා කරන අතර සියළු ආකාරවල සටන් විරාම සාකච්ඡා බල්ලට දමා මානුෂික මෙහෙයුම් කිසිම අඩුපාඩුවක් නැතිව ඉදිරියට ගෙන යා යුතු ය. පළමුව කළ යුත්තේ රටේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම මිස ඊනියා මානව අයිතීන් වෙනුවෙන් කඳුලු සැලීම නො වේ. මානව අයිතීන් ද අවසාන වශයෙන් ගත්කල සංස්කෘතියකට සාපේක්ෂ වන අතර වත්මන් මානව අයිතීන් ඇත්තේ බටහිර සංස්කෘතිය රැකගැනීම සඳහා බව ද අමතක නොකළ යුතු ය. ගුවන්යානයක් පැහැර ගත්විට එහි කොටු වී සිටින මගීන් බේරා ගැනීමට ක්‍රියාකරන ආකාරයට ම ආණ්ඩුව කොටි ත්‍රස්තවාදීන් විනාශ කර හෝ අත් අඩංගුවට ගෙන හෝ කොටු වී සිටින්නන් මුදා ගැනීමට වහා කටයුතු කළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva